ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය **221** - කම්කරු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර**,** කම්කරු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියළුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම**,** විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමෙ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කම්කරු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කම්කරු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදලේ කටයුතු සඳහා වැයකරන මුදල් මාසිකව ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ප්‍රතිපූරණය කරගන්නා අතර, 2024 වර්ෂයේදී එලෙස ප්‍රතිපූරණය කරගත් රු.967,027,707 ක මුදල ආදායම් ශීර්ෂයකට බැර කිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම ලෙස සාවද්‍ය අගයක් සටහන්ව පැවතුනි.	අදහස් දක්වා නොමැත.	මහා භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.

(ආ) පුනරාවර්තන වියදම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සේවක අර්ථසාධක අරමුදලේ කාර්යයන් සඳහා ප්‍රතිපාදන තුලින් දරන ලද වියදම ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ප්‍රතිපූරණය කරගැනීම හා එලෙස ප්‍රතිපූරණය කළ මුදල කම්කරු දෙපාර්තමේන්තුවේ අදාල වැය විෂයයන්ට අඩිහාර කිරීම කළ යුතු වුවද, එකී ක්‍රමවේදය අනුගමනය නොකිරීම හේතුවෙන් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් රු.967,027,707 ක් වූ වියදම් සේවක අර්ථසාධක අරමුදලෙහි වියදම් ලෙසද නැවත වාර්තාකර පැවතුනි.	අදහස් දක්වා නොමැත.	මහා භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.

(ඈ) මූලධන වියදම්

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2024 වර්ෂයේ 221-02-04-2106 වැය විෂයය යටතේ මිලදීගත් රු.3,777,444 ක් වූ පරිගණක මෘදුකාංග දෙපාර්තමේන්තුවේ වත්කම් මිලදී ගැනීම් ලෙස වාර්තා කර තිබූ අතර, 2024 වර්ෂයේ සේවක අර්ථසාධක අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙසද වාර්තාකර තිබුනි.	අදහස් දක්වා නොමැත.	මහා භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.

(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැදුම් ප්‍රකාශය

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට නොහැකිව පවතින සමාලෝචිත වර්ෂය අවසානයේ සේවය හැරගිය, වැඩ තහනම් කළ හා සේවයෙන් පහකළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.1,914,316 ක් වූ අතර ඉන් රු.384,060 ක ශේෂ 6 ක් වසර 10 ඉක්මවූ ඒවා ඉක්මවූ ඒවා විය.	ණය ශේෂ අයකිරීමට ක්‍රියාකරන බව.	ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	වැය විෂයයන් 3 කට අදාලව සලසා තිබූ රු.192,500,000 ක් වූ ප්‍රතිපාදනයන්ගෙන් සමාලෝචිත වර්ෂය තුල කිසිදු වියදමක් දරා නොතිබීමෙන් සියයට සියයක ප්‍රතිපාදන ඉතිරිවීම් නිරීක්ෂණය විය.	ප්‍රතිපාදනයන් වර්ෂය තුල වියදම් නොවීම සම්බන්ධව හේතු පැහැදිලි කරන බව.	ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කල යුතුය.

(ආ)	වැය විෂයයන් 14 කට අදාලව සලසා තිබූ රු.1,157,501,540 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.258,900,994 ක් පමණක් උපයෝජනය කර තිබුනි. මෙම ඉතිරියේ ප්‍රතිශතය සියයට 44 සිට සියයට 96 ක් දක්වා පරාසයක් තුළ පැවතුනි.	ප්‍රතිපාදන ඉතිරිවීම් වලට හේතු පැහැදිලි කරන බව.	ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාව යෙන් උපයෝජනය කළ යුතුය.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	(i) 2016 දෙසැම්බර් 16 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	දෙපාර්තමේන්තුව සතුව වාහන 87 ක් පැවතියද රථවාහන 80 ක ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුනි.	වාහන 07 ක ඉන්ධන පරීක්ෂාවන් සිදුකර ඇති බව.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය
	(ii) වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 05/2020 හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020	දෙපාර්තමේන්තුව සතු ආර්ථික වශයෙන් ඵලදායි නොවන තත්ත්වයේ පවතින වාහන හඳුනාගෙන අපහරණය කිරීම සිදුකල යුතු වුවද මේ සඳහා අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුනි.	අදාල වාහන අපහරණය කිරීම සම්බන්ධ ඉදිරි කටයතු 2025 ජූලි 04 දින සිදු කිරීමට නියමිත බව.	වත්කම් කළමනාකරණ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	2019 සැප්තැම්බර් 27 දින අංක 2142/90 දරණ අති විශේෂ ගැසට් පත්‍රය	ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව කර්මාන්තශාලා නව ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය විධිමත් පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කර නොතිබුනි.	ක්‍රියාවලිය විධිමත් කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව. නිලධාරින්ගේ හිඟය නිසා ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සඳහා යෙදවිය හැකි සංඛ්‍යාව 08 දෙනකුට සීමා වී ඇති බව.	ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.3 තැන්පත් ශේෂයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් තැන්පත් ගිණුමෙහි 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.24,313,744 ක් වූ අතර, එකී ශේෂය තුළ රු.16,327,781 ක් වූ වසර 2 කට වඩා කල් ඉකුත් වූ මෙහෙවර පියෙස ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් සිදුකරන ලද තැන්පතු බවට අනාවරණය විය.	අදාල අංශ විමසීමෙන් මේ සම්බන්ධව තවදුරටත් පැහැදිලි කොට අවසන් පිළිතුරු සැපයිය යුතු බව.	ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	කම්කරු දෙපාර්තමේන්තුවේ 6000-0-0-23-0-58 දරන පොදු තැන්පත් ගිණුම තුල 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.821,969,675 ක් පැවති අතර 2015 ට පෙර පැවති EPF (වන්දි හා පාරිතෝෂික) හි එකතුව රු.7,022,106 ක මුදල් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. 2016 වර්ෂයේ සිට 2024 දක්වා පැවති රු.349,186,269 ක මුදලින් 2025 අප්‍රේල් වන විට තවදුරටත් නිරවුල් කිරීමට ඇති ශේෂය රු.311,596,989 ක් විය.	තැන්පතු 96 නිරවුල් කිරීම සම්බන්ධව දෙපාර්තමේන්තු විගණන කමිටු රැස්වීමේදී සාකච්ඡාවට ගැනෙන බව හා එම තීරණ අනුව කටයුතු කරන බව.	ශේෂ නිරවුල් කිරීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	2024 වර්ෂයට අයත් හිමිකම් ගිණුම් වල කාර්යාල තුනක නියැදි පරීක්ෂාවකදී අදාල දිස්ත්‍රික් කාර්යාල වලට යවා ඇති නමුත් 2025 මැයි මාසය වන විටත්, මැද කොළඹ, බටහිර කොළඹ හා දකුණු කොළඹ කාර්යාල වල පිළිවෙලින් රු.1,539,544, රු.222,740 හා රු.403,600 ක ශේෂයන් වශයෙන් ගෙවීමට පැවතුනි.	අදාල තොරතුරු සනාථ කර ගැනීමෙන් අනතුරුව ගෙවීම් කරන බව.	

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 දැක්ම හා මෙහෙවර

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
එක් වහලක් යටදී සියලු කටයුතු ඉටුකර ගැනීමේ අරමුණ ඇතිව 2008 මැයි 12 දින අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව සාමාජිකයන්	සේවා සේවක දෙපාර්ශවයට අදාළ සේවා එක් වහලක් යටින් සැපැයීමේ අරමුණින් මෙහෙවර පියෙස ගොඩනැගිල්ල ඉදිරිකීමට යෝජනා	සාමාජිකයන් වෙත ප්‍රතිලාභ ලබාදීම හා අවශ්‍ය කටයුතු පහසු කරවීමේ ක්‍රියාමාර්ග ගත යුතුය.

ලියාපදිංචි කිරීමේ සිට සාමාජික මුදල් ගෙවීම පැහැරහරින හාම්පුතුන්ට විරුද්ධව නඩු පැවරීම, සාමාජිකයාගේ ප්‍රතිලාභ ලබා ගැනීම පහසු කරවන සේවක ආර්ථසාධක අරමුදල් ලේකම් කාර්යාලය, මහා බැංකු නිලධාරීන්ගෙන් සමන්විත පරිපාලන ඒකකයක්, නඩු විභාග කිරීමට මහේස්ත්‍රාත් අධිකරණයක්, සාකච්ඡා ශාලාවක්, භෝජනාගාරයක් සඳහා ඉඩකඩ වෙන්කර දීම මෙහෙවර පියෙස ගොඩනැගිල්ල ඉදිකිරීමේ අරමුණ වුවද, එකී කාර්යය ඉටුවී නොතිබුණි. එහෙත් 2024 දෙසැම්බර් වන විට කම්කරු විෂය පථයට සෘජුව අදාල නොවන දේශීය අදායම් දෙපාර්තමේන්තුව (24,25 මහල්) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (26,27 මහල්) බදු කුලී අයකිරීමෙන් තොරව භාවිතා කරමින් පවතින බවට නිරීක්ෂණය විය.	වුව ද, එම කාර්ය පරිපූර්ණ කිරීමට නොහැකි වී ඇත්තේ කම්කරු දෙපාර්තමේන්තුවේ හෝ කම්කරු විෂය භාර අමාත්‍යාංශයේ පාලනයෙන් බැහැරව පවතින නිසා බව.

4.2 **ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම**

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කොග්ගල හා කටුනායක නේවාසිකාගාරවල අළුත්වැඩියාවන් සඳහා 2023 වර්ෂයේදී රු.6,000,000 ක ප්‍රතිපාදනද සමාලෝචිත වර්ෂයේදී රු.2,500,000 ක ප්‍රතිපාදනද වෙන්කර තිබු නමුත් අපේක්ෂිත කාර්යය ඉටුකර නොතිබුණි.	2025 වර්ෂයේදී ක්‍රියාත්මක කරන බව.	ප්‍රතිපාදන වෙන් කරන ලද ව්‍යාපෘති ඉටුකිරීමට කටයුතු කළ යුතුය.

4.3 **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂයේදී මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 16වන මහලේ අභ්‍යන්තර පිරිවිතය සැකසීම සඳහා රු.30,000,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්කරවාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී රු.36,880,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අරම්භ වීම 2024	2025 වර්ෂයේදී ක්‍රියාත්මක කරන බව.	ව්‍යාපෘති ප්‍රමාදයෙන් තොරව ක්‍රියාත්මක කළ යුතුය.

	ඔක්තෝම්බර් දක්වා ප්‍රමාද වීම හේතුවෙන් අදාල ව්‍යාපෘතිය 2024 වර්ෂයේදී ද ඉටුකර ගැනීමට හැකියාව ලැබී නොතිබුණි		
(ආ)	මෙහෙවර පියෙස ගොඩනැගිල්ල 2019 අගෝස්තු 20 දින විවෘත කර කාර්යාල කටයුතු පවත්වාගෙන ගොස් ඇති නමුත් කසල කළමනාකරණ කාර්යසාධන වැඩසටහන 2024 වර්ෂය අවසානය වන විටත් ඉටුකර ගැනීමට හැකිව නොතිබුණි. මේ සඳහා 2023 වර්ෂයේදී රු.5,000,000 ක ප්‍රතිපාදනද, 2024 වර්ෂයේ රු.13,000,000 සලසාගත් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	මෙම කාර්යයට අදාල ඇස්තමේන්තු ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සකස් කරමින් පවතින බව.	කසල කළමනාකරණ පද්ධතිය සකස් කිරීමේ කාර්යභාරය සිදුකළ යුතුය.

4.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2019 වර්ෂයේ රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ අළුත්වැඩියාවන් සඳහා මූලික ඇස්තමේන්තුවක් මත ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත රු.11,177,000 ක මුදලක් ගෙවා තිබුණි. මූලික ඇස්තමේන්තුවේ වහලය හා සිවිලිම අළුත්වැඩියාව සඳහා රු.1,922,500 ක පිරිවැයක් ඇතුලත්කර තිබූ අතර, අළුත්වැඩියාවේ ස්වභාවය මූලික ඇස්තමේන්තුවේ විග්‍රහ කිරීමක් සිදුකර නොතිබූ අතර, යොදනු ලබන ලී, ඇස්බැස්ටෝස් යනාදිය පිළිබඳව පැහැදිලි සඳහනක් නොවිය. විගණන අවස්ථාව වූ 2024 අගෝස්තු වන විට වර්ෂාව පවතින අවස්ථාවලදී වහලයෙන් සිවිලිම ඔස්සේ ජල කාන්දුවීම් සිදුවූ අතර, ආහාර ගන්නා ස්ථානයේ විදුලි පංකාව ඔස්සේ සිදුවන ජල කාන්දුව හේතුවෙන් විදුලිය අක්‍රිය වීම් සිදුවෙමින් පැවතියද මේ පිළිබඳව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව දැනුවත්කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කළමනාකරණ විසින් සිදුකර තිබුණි.	අදහස් දක්වා නොමැත.	වියදමට අදාලව අවශ්‍ය කටයුතු සම්පාදනය නොවීම පිළිබඳව හා අළුත්වැඩියා කටයුතු පිළිබඳව සොයාබලා ඉටු කරවා ගත යුතුය.

4.5 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යනු ලබන ණය ලේඛන නියැදි පරීක්ෂාවකදී (CC10) විධිමත්ව පවත්වා නොගැනීම හේතුවෙන් අවස්ථා 9 කදී නිලධාරී 9 දෙනෙකුගේ ණය ශේෂ නිවැරදිව සටහන් නොවීම් හා සාවද්‍ය ලෙස සටහන් වීම් පැවති බවට නිරීක්ෂණය විය.	පිළිතුරු සපයා නොමැත	ලේඛන විධිමත්ව හා නිවැරදිව පවත්වා ගත යුතුය.
(ආ)	පූර්ව අධ්‍යයනයකින් හා ඇගයීමකින් තොරව භාණ්ඩ හා වැඩ ප්‍රසම්පාදන කාර්යයන් 7ක් සඳහා රු.139,270,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද ඉඩම්වල ගැටළු පැවතීම, PPP ක්‍රමවේදයක් නිසා අත්හිටුවීම, ඩිජිටල් ක්‍රමවේදයක් හඳුන්වා දීම යන ගැටළු හේතුවෙන් 2024 වර්ෂයේදී එකී කාර්යයන් ඉටුකර ගැනීමට නොහැකිව පැවතුනි.	2025 වර්ෂයේදී අවසන් කිරීමට නියමිත බව.	දෙපාර්තමේන්තුවේ කාර්යයන් නිසි අධ්‍යයනයක් හා ඇගයීමෙන් කළ යුතුය.
(ඇ)	රු.7,855,576ක මුදලක් වැයකර 2023 වර්ෂයේදී හම්බන්තොට දිස්ත්‍රික් කම්කරු කාර්යාලය හා සංචාරක බංගලාව අළුත්වැඩියා කර තිබුණද, අවශ්‍ය ලීබඩු හා උපකරණ ප්‍රසම්පාදනය නොවීම හේතුවෙන් භාවිතයට ගැනීමෙන් තොරව පැවතුනි.	2026 වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීමේදී මෙම මිළදී ගැනීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කර ගැනීමට අවධානය යොමු කිරීමට කටයුතු කරන බව.	වත්කම් නිසි පරිදි කළමනාකරණය කළ යුතුය.
(ඈ)	ජා ඇල කම්කරු කාර්යාලය පවත්වාගෙන යාම සඳහා සුදුසු ස්ථානයක් තෝරාගැනීමේදී රථ වාහන නතර කිරීම සඳහා ඉඩ පහසුකම් ප්‍රමාණවත් පරිදි නොමැතිවීම, ආබාධිත ප්‍රවේශය සඳහා අවශ්‍ය පහසුකම් නොසලකා හැරීම යනාදී කරුණු නිරීක්ෂණය වූ අතර අදාල බදු ගිවිසුම වසරක කාලසීමාවකට සීමාකර තිබීම නිරීක්ෂණය විය. අදාල අත්සන් කරන ලද බදු ගිවිසුම්පත්‍රයන්හි උපලේඛනයේ බදු ගන්නා ඉඩ ප්‍රමාණය සඳහන් නොවීම හේතුවෙන් නීතිමය කටයුතු සඳහා ඉදිරියේදී දෙපාර්තමේන්තුවට අවාසිදායක තත්ත්වයක් උදා විය හැකි බවට නිරීක්ෂණය වීම.	අදාල බදු ගිවිසුම්පත් සඳහා බදු ගන්නා ඉඩකඩ ප්‍රමාණය ඇතුළත් කිරීමට ඉදිරියේ දී කටයුතු සිදුකරන බව.	කාර්යාල කටයුතු පවත්වාගෙන යාමට සුදුසු ස්ථාන තෝරා ගත යුතුය.

(ඉ)	රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අයත් බලප්‍රදේශ 13 සඳහා ලේඛන අනුව ලියාපදිංචි ආයතන කම්කරු නිලධාරීන් වෙත බෙදා වෙන්කර තිබූ නමුත් පරිගණක පද්ධතියේ තොරතුරු හා ලේඛනගත තොරතුරු අතර පරස්පරතාවයන් පැවතුනි. ක්ෂේත්‍ර රාජකාරි, අධිකරණ රාජකාරි පැමිණිලි පරික්ෂාව, වාර්තා පසුවිපරම් කිරීම, නිවේදන නිකුත් කිරීම සාරාංශ සකස් කිරීම හා නිවාස ණය සම්බන්ධ රාජකාරි කටයුතු විධිමත් පාලනයක් හා නිසි කළමනාකරණයක් සහිත පරිගණක පද්ධතියක් ක්‍රියාත්මක නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. එමෙන්ම මෙම කාර්යාලයේ පොත්පත් ලේඛන අනුව ආයතන පරීක්ෂාවන් සිදුකරන බවට වාර්තා වී පැවතියද, පරිගණක පද්ධතිය තුල තොරතුරු යාවත්කාලීනව නොපැවතුනි.	රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අයත් බල ප්‍රදේශ 13 ට අදාල දත්තයන් ක්‍රමානුකූලව නිවැරදි කරගෙන යමින් පවතින බව.	පරිගණක පද්ධති හා තොරතුරු නිවැරදිව පවත්වා ගෙන යා යුතුය.
(ඊ)	2017 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ ගංවතුරෙන් ලිපිගොනු විනාශ වීමෙන් ලේඛන සොයාගත නොහැකි බැවින් රු.7,254,381ක මුදලක් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු සූදානම් කර තිබූ අතර, අවදානම් සහිත පරිසරයක පවතින කාර්යාල පරිශ්‍රයක් වුවද තොරතුරු පද්ධතියක් හෝ පවත්වාගෙන යාමට කටයුතු සම්පාදනය කර නොතිබුනි	ඉදිරියේදී කටයුතු කරන බව.	ලිපිගොනු සුරක්ෂිත කිරීමට කටයුතු කළ යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරී පුරප්පාඩු ප්‍රතිශතය සියයට 42ක් වන අතර තෘතිය මට්ටමේ පුරප්පාඩු ප්‍රතිශතය සියයට 25කි. පුරප්පාඩු ප්‍රමාණය ඉහල ප්‍රතිශතයක් ගැනීම මඟින් ආයතනික ධුරාවලිය තුල තීරණ ගැනීම, වගකීම් භාර ගැනීම, අධීක්ෂණය සහ මඟ පෙන්වීම වැනි අවස්ථාවන් වලදී ප්‍රායෝගික ගැටළු ඇති විය හැකි බව නිරීක්ෂණය විය.	ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව.	බඳවා ගැනීම් සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම සහ සේවක කළමනාකරණය සිදුකරගත යුතුය.

(ආ)	දෙපාර්තමේන්තුව කම්කරු ක්ෂේත්‍රයට අයත් වන පනත් 14ක පමණ රාජකාරි කටයුතු, විමර්ෂණ කටයුතු, දෛනිකව මහජනතාව සම්බන්ධ රාජකාරිවල නිරත වීම හේතුවෙන් කළමනාකරණ සේවයේ නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතීම කාර්යක්ෂමතවයට බාධා එල්ල වී තිබුණි.	පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව.	පුරප්පාඩු පවතින තනතුරුවල කාර්යයන් කළමනාකරණය කිරීමට පියවර ගත යුතුය.